මාධ්‍ය නිවේදනය

**2018 ජූලි 09, කොළඹදී...**

# නෙස්ලේ සමාගමේ කිරි දිස්ත්‍රික්ක ආදර්ශනයේ සාර්ථකත්වයෙන් දහස් ගණන් සුළු පරිමාණ කිරි ගොවීන්ට සෙත සැලසේ

කිරි කර්මාන්තයෙන් තිරසාර ජීවිකාවක් ගොඩනැංවූ බණ්ඩාර මැණිකේගේ කතාව

වසර දහස් ගණනක් තිස්සේ පැවත එන සම්ප්‍රදායික දේශීය කිරි කර්මාන්තයට, ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට සහ ළමා පරපුරේ පෝෂණීය අවශ්‍යතා සපුරාලීමට ඇත්තේ සුවිසල් හැකියාවකි. දේශීය කිරි කර්මාන්තය ඉදිරියට ගෙනයාමේදී සුළු පරිමාණ කිරි ගොවීන්, එනම් ගෘහාශ්‍රිත කර්මාන්තයක් ලෙස කිරි කර්මාන්තයේ නියැළී සිටින අයට ප්‍රමුඛස්ථානයක් හිමිවේ.

කෙසේ වුවද ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය තවමත් වර්ධනය වෙමින් පවතින්නකි. එනම් තවමත් ඉල්ලුමට සරිලන සැපයුමක් නොමැත. දේශීය කිරි නිෂ්පාදනය පුළුල් කිරීමත්, කිරිවල ප්‍රමිතිය උසස් කරලීමත් වෙනුවෙන් නෙස්ලේ සමාගම ශ්‍රී ලංකා රජය සමඟ අත්වැල් බැඳගත්තේ 1980 දශකයේදී ය. ඒ කිරි කර්මාන්තය දියුණු කිරීමේ කිරි දිස්ත්‍රික්ක ආදර්ශනයක් හඳුන්වාදෙමිනි. නෙස්ලේ සමාගම වර්තමානයේදී ද කිරි ගොවීන් 20,000කට පමණ සංඛ්‍යාවකට නිරන්තර පුහුණු වැඩසටහන්, තාක්ෂණික සහ ක්ෂුද්‍ර මූල්‍ය සේවා සහාය, ජංගම සත්ත්ව ප්‍රතිකාර සායන, කිරි භාජන සහ වෙනත් සම්පත් ලබාදීම ආදී සේවාවන් රැසක් පිරිනමයි. තව ද කිරි එකතුකිරීමේ මධ්‍යස්ථාන, කිරි නැවුම්ව තැබීමට උපකාරී වන ශීත මධ්‍යස්ථාන වැනි යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා ක්‍රමවත් ලෙස ආයෝජනය කරමින් කිරි ගොවීන්ට වෙළෙඳපොළ ජයගැනීමට ද අවස්ථාවක් නිර්මාණය කරදී තිබේ.

නෙස්ලේ සමාගමේ මෙහෙවර ඔස්සේ උසස් ප්‍රමිතියෙන් යුත් නැවුම් දේශීය කිරි වෙළෙඳපොළට නිකුත් කිරීමත්, පාරිභෝගිකයින්ට උසස් ප්‍රමිතියෙන් හා පෝෂ්‍ය ගුණයෙන් යුත් දේශීය කිරි නිෂ්පාදන ලබාදීමත් සිදුවන අතරේදීම 'බණ්ඩාර මැණිකේ' වැනි සුළු පරිමාණ කිරි ගොවීන්ට තම ව්‍යාපාර දියුණු කරගැනීමටත් පවුලේ ආර්ථිකය සරු කරගැනීමටත් දායකත්වය සපයයි.

බණ්ඩාර මැණිකේ සහ ඇගේ ස්වාමි පුරුෂයා කිරි ගොවි කර්මාන්තයට යොමුවුණේ රට තුළ රැකියා අවස්ථාවන් විරල වූ 1980 දශකයේදී ය. "රට තුළ යුද්ධයක් තිබුණා. මගේ මහත්තයටත් කිසිම රැකියාවක් තිබුණේ නැහැ" රඹුක්කන ප්‍රදේශයේ ඈත දුෂ්කර ගම්මානයක වෙසෙන බණ්ඩාර මැණිකේ කියන්නීය. "ඉතින් ස්ථිර ආදායමක් ලබාගැනීමට අපි දෙදෙනා කිරි කර්මාන්තයට යොමුවුණා". එහෙත් 2005 වසරේදී ඇගේ ස්වාමි පුරුෂයා හදිසියේ රෝගාතුර වීමත් සමඟ කිරි ව්‍යාපාරයේ සියලු බර කරට ගැනීමට ඇයට සිදුවිය.

මුලදී ස්වාමියාගේ සහායෙන් තොරව කිරි ගොවිතැනෙහි යෙදීම ඇයට ඉතා දුෂ්කර විය. එහිදී ඈ වඩාත්ම අසීරුතාවකට පත්වූයේ කිරි දෙවීමේදී ය. "අතින් කිරි දෙවීම කියන්නේ ගොඩක් අමාරු, මහන්සි වැඩක්. විශේෂයෙන් දෙනුන් ගොඩදෙනෙකුගේ කිරි දොවද්දී ඒක තවත්

අමාරුයි. නෙස්ලේ පුහුණු වැඩසටහන්වලට යාමට මට අවස්ථාව ලැබුණේ ඔය වෙලාවේදියි. නෙස්ලේ සමාගමේ කෘෂි සේවා නිලධාරීන් හරියාකාරව දෙනුන්ගෙන් කිරි දෙවීමට ඉගැන්වූවා. ඒ හරහා උසස් ප්‍රමිතියෙන් යුතු කිරි නිෂ්පාදනය කරන්න මට හැකිවුණා. ඒ වගේම අලුත් තාක්ෂණය ගැනත් සතුන්ගේ සුබසාධනය ගැනත් ඔවුන් මට කියාදුන්නා. යන්ත්‍ර උපකරණ සහ තණකොළ ආරක්ෂා කරගැනීමට යකඩ කම්බි මිලදීගැනීම වෙනුවෙන් පොළී රහිත ණයකුත් ලබාදුන්නා. සෑම දින 15කටම වරක් නෙස්ලේ සමාගම මම සපයන කිරි වෙනුවෙන් මුදල් ගෙවන නිසා අවශ්‍ය මොහොතකදී බාහිර ණයක් වුණත් ලබාගැනීමේ හැකියාව පවතිනවා”.

මූල්‍ය සහ තාක්ෂණික ආධාර සැපයීමෙන් පමණක් නොනැවතී බණ්ඩාර මැණිකේට තිරසාර කිරි ගොවි කර්මාන්තයකට යොමුවීමට ද නෙස්ලේ අතහිත දී තිබේ. ගොමවලින් ජීව වායු නිපදවා ඇගේ කිරි ගොවිපොළ මෙන්ම නිවසටත් විදුලිය සැපයීමට ඒ හරහා හැකිව ඇත.

අද වනවිට නෙස්ලේ සමාගම වෙත සපයන කිරි හරහා රුපියල් 80,000ක මාසික ආදායමක් ඉපැයීමට බණ්ඩාර මැණිකේ සමත්ව සිටින්නීය. ඒ තමන් ක්‍රමයෙන් වර්ධනය කරගත් ව්‍යාපාරය පිළිබඳ නිහඬ ආඩම්බරයකින්ද යුතුව ය. කිරි ගොවි කර්මාන්තය තුළ ඇගේ විශිෂ්ට දායකත්වය වෙනුවෙන් නෙස්ලේ ඇයට සම්මාන පිරිනැමූ අවස්ථා හේතුවෙන් ඈ අද වන විට ජනාධිපතිවරු තිදෙනෙකු ද තවත් බොහෝ ඇමැතිවරු ද හමුවී තිබේ. ඈ සපයන උසස් ප්‍රමිතියෙන් යුතු කිරි සේම ඇගේ ගොවිපොළ හා සත්ත්ව කළමනාකරණය වෙනුවෙන් බණ්ඩාර මැණිකේ මෙරට හොඳම කිරි ගොවීන් 100 දෙනා අතුරින් එක් අයෙකු ලෙස ද නෙස්ලේ සමාගම ඇගැයීමට පාත්‍ර කර ඇත. ඒ හරහා ඇයට තම ගම තුළ මෙන්ම සෙසු කිරි ගොවීන් අතර ද ඉහළ සමාජ පිළිගැනීමක් හිමිව තිබේ.

“මේ සියලු සම්මාන මට ගෞරවයක් සහ ආඩම්බරයක්. වර්තමානයේදී කිරි ගොවීන්ට හිමිවන අවධානය ගැනත් මට ගොඩක් සතුටුයි. මොකද කිව්වොත් අපි සියලුදෙනාවම එක තැනකට කැඳවලා සම්මාන ලබාදීම කියන්නේ කිරි ගොවියෙකුට ලොකු සතුටක් ගෙනදෙන ක්‍රියාවක්. ඇතැම් අය අපව කිරි ගොවීන් ලෙස සලකමින් අවතක්සේරු කරන අවස්ථා තිබුණත් මේ වගේ පියවර තුළින් අපේ රැකියාවට අගයක් සහ අභිමානයක් ලැබෙනවා” ඈ වැඩිදුරටත් පැවසුවාය.

මේ සියල්ලටම ඉහළින් ඈ සතුටු වන්නේ තම දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදීමට හැකිව ඇති නිසාවෙනි. තම දරුවන් හොඳින් ඉගෙනගෙන මතුදිනෙක තම ව්‍යාපාරය තවත් පුළුල් කිරීමට දායකත්වය ලබාදෙනු ඇතැයි බණ්ඩාර මැණිකේ බලාපොරොත්තු වන්නීය. දැනට ඇය දිනකට කිරි ලීටර 40ක් නිපදවයි. ඉන් කොටසක් පවුලේ පරිභෝජනය සඳහා තබාගන්නා ඇය තවත් කොටසක් තම ගමේ හිතවතුන්ට ලබාදෙයි. ඉතිරිය ඇය නෙස්ලේ සමාගමට අලෙවි කරන්නීය. සෑමවිටම නව අභියෝග භාරගැනීමේ සූදානමින් සිටින බණ්ඩාර මැණිකේගේ මීළඟ ඉලක්කය වන්නේ දිනකට කිරි ලීටර 100ක් නිපදවීමයි.

“මේක තමයි ඉතින් මගේ කතාව” ඈ කියන්නීය. “මගේ ව්‍යාපාරය අද පවතින තැනට ගේන්න මම ගොඩක් මහන්සි වුණා. මොකද මම මුහුණදීපු කරදරවලට මගේ දරුවන් මුහුණ දෙනවා දකින්න මට ඕන වුණේ නැහැ. මේ වෙද්දි නෙස්ලේ වගේ සමාගම් නිසා කිරි ගොවීන්ට ලොකු සහායක් ලැබෙනවා වගේම ව්‍යාපාර අවස්ථාත් ඕනෑ තරම් පවතිනවා. ඒ නිසා මගේ දරුවනුත් මේ ව්‍යාපාරයට යොමුවෙලා එයාලගේ අධ්‍යාපනය තුළින් ව්‍යාපාරය දියුණු කරනවා දකින්නයි මම කැමැති”.

"අනෙක් අතට කිරි නිෂ්පාදනය කියන්නේ රටට සේවයක්. හොඳ ප්‍රමිතියකින් යුතු දේශීය කිරි නිෂ්පාදනය කිරීමේ ලොකු අවශ්‍යතාවයක් පවතිනවා. ඊට දායකවීමෙන් මමත් මව්රටට යම් සේවයක් කරනවා".